පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2026.10.27

## මාධ්‍ය නිවේදනය

**පාර්ලිමේන්තුවේ සමගි ජන බලවේගයේ සහ විපක්ෂ මන්ත්‍රීවරුන් විසින් නිකුත් කළ මාධ්‍ය නිවේදනයයි.**

කථානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතාට එල්ල වී ඇති පෞද්ගලික විෂමාචාර චෝදනා පදනම් කරගනිමින් විපක්ෂය විසින් ඉදිරිපත් කළ විශ්වාස භංග යෝජනාව, චෝදනාවට ලක්වූ කථානායකවරයා විසින්ම මුලසුන දරන පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී විවාදයට ගැනීම ප්‍රතික්ෂේප කිරීම ප්‍රජාතන්ත්‍රවාදය තුළ විපක්ෂයට ඇති අයිතියට බරපතළව ලෙස එල්ල කළ පහරක් බව අපි අවධාරණය කරන්නෙමු.

විශ්වාස භංග යෝජනාව ප්‍රතික්ෂේප කිරීමට ආණ්ඩුව ඉදිරිපත් කරනු ලැබූ කරුණු කිසිදු තර්කානුකූල බවකට හෝ සාධාරණයකට යටත් නොවේ. නීති විශාරදයින්ගේ මතය අනුව, විශ්වාස භංග යෝජනාවේ සඳහන් කරුණු කිසිවක් අධිකරණමය ක්‍රියාවලියකට යටත් බවට (sub-judice) ආණ්ඩුව ගෙන එන තර්කය කිසිසේත්ම සත්‍යයක් නොවේ. එමෙන්ම ආණ්ඩුව ඉදිරිපත් කරන චෝදනා පිළිබඳව තර්කය බිඳ වැටෙන තවත් කරුණක් වන්නේ මෙම චෝදනාවලට පදනම් වී ඇත්තේ කථානායකවරයාගේ පෞද්ගලික ලේකම් විසින් යොමු කරන ලද ලිපියකට අනුව සකසන ලද "කථානායකවරයා පිළිබඳ රහස්‍ය තොරතුරු මාධ්‍යයට හෙළිදරවු වීම පිළිබඳ විමර්ශනයේ වාර්තාව" නමැති පාර්ලිමේන්තු වාර්තාවක් මූලාශ්‍රය වී තිබීමයි.

උක්ත කරුණ අරබයා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව කථානායකවරයාට එරෙහිව පරීක්ෂණයක් පවත්වන මොහොතක කථානායකවරයා එම ධූරයේ කටයුතු කිරීම සදාචාර සම්පන්න නොවන බව විපක්ෂයේ ස්ථාවරයයි. කථානායකවරයා එම පරීක්ෂණය පැවැත්වෙන කාලසීමාව තුළ හෝ ධූරයෙන් ඉවත් විය යුතුය. එවැනි සදාචාරසම්පන්න භාවිතයක් දක්නට නොලැබෙන තැන විපක්ෂයට ඇති අයිතිය වන්නේ මෙවැනි විශ්වාස භංග යෝජනාවක් ගෙන ඒමයි.

ඒ අනුව, මෙම විශ්වාස භංග යෝජනාව 2026 ඔක්තෝබර් 09 දින පාර්ලිමේන්තුවට භාරදෙන ලදුව, 2026 ඔක්තෝබර් 12 දිනෙන් පාර්ලිමේන්තු න්‍යාය පුස්තකයට ඇතුළත් කරන ලදි. පසුව කථානායකවරයා දිවයිනෙන් බැහැරව සිටියදී නියෝජ්‍ය කථානායකතුමාගේ ප්‍රධානත්වයෙන් 2026 ඔක්තෝබර් 12 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ දී යෝජනාවේ අඩංගු චෝදනා හෝ ප්‍රකාශ අධිකරණ ක්‍රියාවලිය සමග සට්ටනයක් සිදුවේද යන්න නීතිපතිවරයා විමසා වාර්තාවක් ලබාගැනීමට යෝජනා විය. එහෙත් කාරක සභා රැස්වීමේදී එකඟවූ පරිදි විශ්වාස භංග යෝජනාව මේ දක්වා නීතිපතිවරයා වෙත ඉදිරිපත් කර නොමැත.

ඉන්පසුව කථානායකවරයාගේ ප්‍රධානත්වයෙන් 2026 ඔක්තෝබර් 23 දින පැවති පක්ෂ නායක රැස්වීමේදී කථානායකවරයාගේ සහ ආණ්ඩුවේ ස්ථාවරය වූයේ නීතිපතිවරයා විමසා කටයුතු කිරීම අවශ්‍ය නොවන බවත් චෝදනා විපක්ෂය විසින් සංශෝධනය කොට භාර දෙන්නේ නම් පමණක් ඒ පිළිබඳව කටයුතු කිරීමට හැකියාවක් ඇති බවය. මෙය චෝදනාවට ලක් වූ පුද්ගලයා විසින්ම තමාගේ චෝදනාව විවාද කිරීම වැළැක්වීමේ අරමුණින් රැස්වීම මෙහෙයවා ගනු ලැබූ තීරණයකි.

කථානායකවරයාට එරෙහිව පවතින බරපතළ චෝදනා ඉවත් කර ගැනීමට ආණ්ඩුව දරන කුමන්ත්‍රණයට යටව ආණ්ඩුව යෝජනා කරන ආකාරයට හෝ ආණ්ඩුවට කැමති අන්දමට චෝදනා සංශෝධනය කිරීමට හෝ ඉවත් කිරීමට විපක්ෂය සූදානම් නොවන බව අවධාරණය කරන්නෙමු.

ශිෂ්ඨ සම්පන්න හෝ සුපිළිපන් ආණ්ඩුකරණයක් ආණ්ඩුවේ භාවිතාව නම්, දැන් කළයුතුව ඇත්තේ කථානායකවරයා සිය ධූරයෙන් ඉල්ලා අස්වීමයි. නොඑසේ නම්, තමන්ට එරෙහි චෝදනා 50ට නොබියව මුහුණ දීම පමණි. ආණ්ඩුව විසින් ගෙන ඇති ඉහත තීන්දුව තුළින් සිදුව තිබෙනුයේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට බරපතළ අනතුරකි. එම අනතුර පිළිබඳව රටේ සියලුම ජනතාවගේ අවධානය යොමු කරන්නෙමු.

**මාධ්‍ය අංශය**
පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලය